**බැංකු පරිපාලනය**

මුදල් නීති පණතේ 29(1) වන වගන්තියේ ප්‍රකාර, 1959 වර්ෂයේ දී බැංකු පරිපාලන දෙපාර්ත මේන්තුව විසින් වෙළඳ බැංකු 11ක් පරීක්ෂා කර බලන ලදී.

මේ දෙපාර්තමේන්තුව විසින් 1957 අංක 12 දරණ බැංකු හර බඳු පණත ක්‍රියාවේ යෙදීම හා සම්බන්ධ යම් යම් කාර්යයන් ද ඉටු කර ගෙන යන ලදී.

## V පෞද්ගලික

ආතර් රණසිංහ සිරිමතාණෝ 1959 ජුලි 1 වැනි දින සිට අධිපති ධුරයෙන් ඉවත් වූහ. මුදල් නීති පණතේ 12 (1) වන වගන්තියේ නියමයන් අනුව ඩී. ඩබ්ලිව්. රාජපතිරාණ මහතා මහ බැංකුවේ අධිපති වශයෙන් 1959 ජුලි 1 වැනි දින සිට පත් කරන ලදී. 1959 සැප්තැම්බර් 14 වැනිද රාජපතිරාණ මහතා ලන්ඩනයේ පවත්වන ලද පොදුරාජ්‍ය මණ්ඩලයේ මුදල් ඇමති වරුන්ගේ රැස්වීමට හා වොෂින්ටන්හි පවත්වන ලද ජාත්‍යන්තර මුදල් මණ්ඩලයේ හා ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුවේ අධිපතිවරුන්ගේ රැස්වීමට සහභාගි වීම සඳහා දිවයිනෙන් පිටව ගියේය. ඒ මහතා ආපසු පැමිණියේ 1959 ඔක්තෝබර් 15 වැනි දය.

මුදල් මණ්ඩලයේ පත් කරන ලද සාමාජික ජේ. ත්‍යාගරාජා මහතා 1959 ජුලි 1 වැනි දින් සිට නැවත එම තනතුරට පත් කර ගනු ලැබීය.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ධුරය දරූ ඩී. ඩබ්ලිව්. රාජපතිරාන මහතා දිල්ලි නුවර පවත්වන ලද අග්නිදිග ආසියා රටවල හා නිව්සීලන්තයේ මහ බැංකු අධිපතිවරුන්ගේ සම් මේලනයේ සහා රැස්වීමට සහභාගිවීම අඳහා 1959 පෙබරවාරි මස 28 වැනි දින දිවයිනෙන් බැහැර ගියේය. ඒ මහතා ඇපසු පැමිණ මහ බැංකුවේ වැඩ බාර ගත්තේ 1959 මාර්තු 9 වැනිද සිටය. ඩී. ඩබ්ලිව්. රාජපතිරාණ මහතා දිවයිනෙන් පිට වී ගිය දින සිට ආපසු පැමිණෙන තෙක් නියෝජ්‍ය අධිපති ඩබ්ලිව්. තෙන්නකෝන් මහතා මුදල් නීති පණතේ 24 වැනි වගන්තිය අනුව ජ්‍යෙෂ්ඨ තැන වශයෙන් නම් කරනු ලැබීය.

මහ බැංකුවේ උපදේශක තැන වශයෙන් අවුරුදු දෙකක කාලයක් බැංකු සේවයේ යෙදී මෙන්, ඊ. බී. බෙනට් මහතා 1959 මැයි 1 වැනිද තම සේවා කාලය සම්පූර්ණ කළේය. අධිපතිවරුන්ගේ සහකාර පී. ඈම්. ජයරාජන් මහතා 1959 නොවැම්බර් මාසයේ සිට 1960 ඔක්තෝබර් මාසය දක්වා වූ කාලය සඳහා ජාත්‍යන්තර මුදල් මණ්ඩලයේ මහ බැංකුවේ විකල්ප විධායක අධ්‍යක්ෂක වශයෙන් යවන ලදී. ඒ මහතා විසින් 1955 නොවැම්බර් 1 වැනි දින ජාත්‍යන්තර මුදල් මණ්ඩලයේ වැඩ බාර ගන්නා ලදී. ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුවේ විකල්ප විධායක අධ්‍යක්ෂ වශයෙන් ක්‍රියා කළ ඩී. සී. ගුණසේකර මහතා ගේ පත්වීම 1959 ඔක්තෝබර් 31 වැනිද අවසන් විය. ඒ මහතා 1959 නොවැම්බර් 19 වැනිද මහ බැංකුවේ නැවතත් රාජකාරියෙහි යෙදුණු අතර, 1959 නොවැම්බර් 23 වැනිද සිට අධිපති වරුන්ගේ සහකාර තැන වශයෙන් පත් කර ගන්නා ලදී.